5 මුනි සිරිපා සිඹිමින්නේ

ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි (1901-1951)

'ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි' යනු මෙරට ජාතික වීරවරයන් ගැන කියැවෙන අවස්ථාවන්හි දී නොවැරදී ම සඳහන් වන සුවිශේෂ නාමයකි. සුවිශේෂත්වය වන්නේ අප රට ගැන, එහි නිදහස ගැන ඉමහත් වාත්සල්‍යයකින් ලියූ - දෙසූ උන් වහන්සේ උපතින් ශ්‍රී ලාංකිකයකු නොවීම ය.

ටිබෙට් රටෙහි සිකීම් දේශයේ උපන් මහින්ද හිමියන්ගේ ළමා කාලය පිළිබඳ වැඩිදුර තොරතුරු සපයා ගැනීම අපහසු ය. එහෙත් උන් වහන්සේ 1901 දී පමණ ජන්ම ලාභය ලැබූ බව පිළිගැනේ. ටිබෙට් රටෙහි උසස් පෙළපතක් වූ තෂි නම්ග්‍යාල් පෙළපතට අයත් මහින්ද හිමි ඇස්.කේ. තෂි නම්ග්‍යාල් ලෙස මුල දී හඳුන්වා ඇත. වයස අවුරුදු දොළහේ දී පමණ සිය පැවිදි සොහොයුරා වූ එස්. පුණ්ණජී හිමියන් සහ ජර්මන් ජාතික ඤාණාතිලෝක හිමියන් සමග කුඩා තෂි ලංකාවට පැමිණ ඇත.

මුලින් ම පොල්ගස්දූව ආරාමයේ නැවතී, කොළඹ විද්‍යෝදය පිරිවෙනට බැඳී ඉගෙනීමටත් එම කාලයේ ම මරදානේ මහාබෝධි විද්‍යාලයෙන් ඉංග්‍රීසි ඉගෙනීමටත් ඔහු යොමු වී ඇත. තෂි නම්ග්‍යාල්, එස්. මහින්ද හිමි ලෙස පැවිදි බව ලබන්නේ රත්ගම සිරි චූලසුමන හිමියන් වෙතිනි. මෙලෙස අමරපුර නිකායේ පැවිදි ව දොඩන්දූවේ ශෛලබිම්බාරාමයෙහි වැඩ වෙසෙමින් මහින්ද සාමණේර හිමියෝ සිය අධ්‍යාපන කටයුතු කරගෙන ගියහ. පසු ව උන් වහන්සේ කොළඹ කොම්පඤ්ඤ වීදියේ සෞගත ආවාසය වෙත පැමිණියහ. ඒ 1930 වර්ෂයේ ය. එහි දී උන් වහන්සේ පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන් අධිපති ලුණුපොකුණේ ශ්‍රී ධම්මානන්ද හිමියන් වෙත යළි පැවිදි වූයේ සියම් නිකායේ භික්ෂුවක හැටියට ය. මහින්ද හිමියන් උපසම්පදා වී ඇත්තේ 1931 වර්ෂයේ ය.

1934-1936 කාල වකවානුව තුළ එස්. මහින්ද හිමියෝ කොළඹ ආනන්ද විද්‍යාලයේ ආචාර්යවරයකු ලෙස සේවය කළෝ ය. එහි දී උන් වහන්සේ සිංහල, පාලි, බුද්ධ ධර්මය විෂය ඉගැන්වීම් කටයුතු සිදු කර ඇත. එස්. මහින්ද හිමියන් 1936 වර්ෂයේ සිට වැඩ වාසය කර ඇත්තේ පානදුරේ මහබෙල්ලන ශ්‍රී සුදර්ශනාරාමයේ ය. එහි වසර 15ක් පමණ වැඩ වෙසෙමින් විවිධ සමාජ ආගමික සාහිත්‍ය සේවාවන් සිදු කරමින් සිටිය දී 1951 මාර්තු 16 දා මේ උද්යෝගිමත් බුද්ධපුත්‍රයන් වහන්සේ හදිසියේ අපවත් වූහ.

එස්. මහින්ද හිමියන් වඩාත් ප්‍රකට වූයේ කවියකු හා දේශකයකු ලෙසට ය. උන් වහන්සේගේ සාහිත්‍ය කටයුතු බෙහෙවින් ම කවියට නැඹුරු විය. එම කවි ප්‍රධාන තේමා තුනක් යටතේ අපට හඳුනා ගත හැකි ය.

1. ළමයින් උදෙසා ලියූ කවි
2. දේශානුරාග හා ජාතිකාභිමාන කවි
3. බුද්ධාභිවන්දනා කවි

ඉහත සෑම වර්ගයක ම කවි වර්තමානයේ දී ද පාඨක, රසික, විචාරක අවධානයට ලක්ව පවතී. උන් වහන්සේ ලියූ ජාතිකාභිමානී කෘති අතර **නිදහසේ දැහැන**, **නිදහසේ මන්ත්‍රය** සහ **ලංකාමාතා** කාව්‍ය සංග්‍රහ ජනප්‍රිය විය. යටත් විජිත පාලනයෙන් මිදීම සඳහා කළ නිදහස් සටනට උන්වහන්සේගේ නිර්මාණවලින් ලද උත්තේජනය සුවිශේෂ ය.

බලවු පොලොන්නරු අනුරාපුර　　　　පෙදෙස
සිතවු පැවති නිදහස මෙහි පෙර　　　　දවස
නගවු තව තවත් තරසර තරුණ　　　　ගොස
වරෙවු යමවු නැගිටිවු නොනිදවු　　　　මෙලෙස

ඇස්. මහින්ද හිමියෝ කුඩා දරුවන් උදෙසා ද කාව්‍ය ප්‍රබන්ධ රැසක් කළහ. උන් වහන්සේ විසින් රචිත ළමා නිර්මාණ මූලික වශයෙන් **කව්මිණ**, **කව්මුතු** හා **ළමා කව් කලඹ** යන කෘති තුනෙහි සංගෘහිත වී ඇත. **ඔවා මුතු** උන් වහන්සේ ලියූ මුල් ම කාව්‍ය කෘතිය යි. **නන්දන ගීත** උන් වහන්සේ ලියූ තවත් කෘතියකි.

මෙම පාඩමට පාදක වන '**දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල**' නමැති දීර්ඝ කාව්‍ය පන්තිය ජාතික වීර කාව්‍යයක් බවට පත් ව තිබේ. මෙය ළමයින් අරමුණු කර ගෙන මුළු මහත් ජාතිය ම අමතන කාව්‍යයකි. ජාතික සිරිත් විරිත්, ආකල්ප හා චින්තනය කැටි කර ගත් උපදේශාත්මක කාව්‍යයක් වන මෙය ඉතිහාස තොරතුරු රැසක් ද සම්පිණ්ඩනය කළ අවස්ථාවකි.

'ජාතික තොටිල්ල' පද්‍ය පන්තිය රචනා වීම පිළිබඳ පසුබිම් කතාව ද අපූර්ව එකකි. දිනක් මහින්ද හිමියෝත් භදන්ත මංජු හිමියෝත් පියදාස පලන්සූරිය මහතාත් ඇම්.ඊ. ප්‍රනාන්දු මහතාත් අගනුවර සිට මහනුවරට ගොස්, ගන්නෝරුව හරහා යටිගල සුමනාරාමයට යමින් සිටියහ. පිරිස එක්තරා වෙල්යායකට පිවිසෙන විට හොඳට ම සවස් වී තිබිණ. එම සුන්දර පරිසරය ගැන මහින්ද හිමියෝ වශීකෘත ව ගියෝ ය. වෙල මැද වූ කමතක පොල් අතු පැල දුටු උන් වහන්සේ "අපි අද රෑට මේ පැලේ නතර වෙමු" යැයි යෝජනා කළහ. සියල්ලෝ එකඟ වූහ. සඳ පහන් රැයෙහි වෙල්යාය තවත් සුන්දර වී තිබිණි. පොල් අතු පැල එකම සාහිත්‍ය මණ්ඩපයක් විය. මහින්ද හිමියන්ගේ සිත අමුතු සතුටකින් පිරී ගියේ ය. විගස පෑන හා කඩදාසියක් අතට ගත් උන් වහන්සේ 'දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල' යන සිරස්තලය යොදා 'මුනි සිරිපා සිඹිමින්නේ' කවි පදයෙන් කවි පෙළක් ඇරඹූහ. එලෙස පල්ලේගම කෝලාන ගමේ වෙල් යායේ දී ඇරඹි මේ කවි පෙළ පසු දා

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

සුමනාරාමයේ දී ම ලියා අවසන් කෙරිණ. මේ හෘදයග්‍රාහී ජාතික වීර කාව්‍යයේ උපත සිදු වූයේ එලෙස ය. එම කාව්‍යයෙන් උපුටා ගත් කවි කිහිපයක් මෙම පාඩමට ඇතුළත් කර ඇත.

'ජාතික තොටිල්ල' දේශාභිමානි කාව්‍යයේ තෝරා ගත් කවි කිහිපයක් මතු දැක්වේ.

මුනි සිරිපා	සිඹිමින්නේ
සමනොළ ගිරි	පෙදෙසින්නේ
මඳ සුළඟයි මේ	එන්නේ
මගේ පුතා	නිදියන්නේ
නිදහස මහ මුහුදක්	වේ
එහි උල්පත පුත, නුඹ	වේ
ඒ බව සිහි කොට මෙ	ලොවේ
යුතුකම ඉටු කළ යුතු	වේ
ජාතික රණ දෙරණ	මතේ
ගැටී වැටී මළ	මොහොතේ
සුන්දර සුරඹුන්ගෙ	අතේ
නැළවෙන බව සිතනු	පුතේ
කරදර දහසක් හමු	වී
ඉන්ටැකි නම් සිනා	වෙවී
ඔහු මෙලොවට පහළ	දෙවී
රජෙකැයි සලකනු	මැනවී
තමන් ලැබූ දිවි	පෙවෙතේ
කොටසක් රට සමය	වෙතේ
පුද නොකළොත් උඹෙන්	පුතේ
මෙලොවට කිසි පලක්	නැතේ
ජාතිය රන් විමනක්	වේ
ආගම මිණි පහනක්	වේ
එය රැක ගන්නට මෙ	ලොවේ
සමත් වෙතොත් පුත නුඹ	වේ
ඉටු කොට කළ යුතු	යුතුකම්
ලැබුණත් ලෝකෙන්	ගැරහුම්
ඉවසන්නට පුළුවන්	නම්
උඹයි මගේ පුතා	උතුම්

කාටත් හිමි පොදු දේ නම්
නැති-බැරි, හිඟ අවහිරකම්
මේ දේ මැඩ ගෙන දස්කම්
පෑම තමයි සුරු විරුකම්

මිතුරුකමින් පෙරට එතොත්
දූවිල්ලක් එක්ක වුණත්
මිතුරු වෙයන් පුතේ උඹත්
එයයි ලොවේ ගුණය මහත්

සිනිඳු මොළොක් බව මලෙහී
පිරිසිදු බව පිනි බිඳෙහී
එක් වී මා පුතුගෙ ළෙහී
අරක් ගනී හැම දිනෙහී

අභ්‍යාස

1. පහත සඳහන් යෙදුම්වල අරුත් පැහැදිලි කරන්න.

   "කරදර දහසක් හමු වී
   ඉන්ටැකි නම් සිනහ වෙවී"

   "නිදහස මහ මුහුදක් වේ
   එහි උල්පත පුත, නුඹ වේ"

   "කාටත් හිමි පොදු දේ නම්
   නැති-බැරි හිඟ අවහිරකම්"

2. මෙහි ජාතිකාභිමානී හා දේශානුරාගී අදහස් වඩවන කවි තෝරා සාකච්ඡා කරන්න.

3. මෙම පද්‍ය නිර්මාණය සාර්ථක කර ගැනීමට කවියා යොදා ගෙන ඇති විවිධ කාව්‍යමය උපක්‍රම සාකච්ඡා කරන්න.

4. මෙම නිර්මාණය සඳහා උපයුක්ත භාෂා ශෛලිය පිළිබඳ ඇගයීමක් කරන්න.

5. "චරිත සංවර්ධනයට නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කරන ප්‍රතිභාපූර්ණ කවියෙක් මෙම නිර්මාණයේ දී අපට හමු වේ." මේ කියමන සාකච්ඡා කරන්න.